මහනුවර මහා නගර සභාව

2027 වර්ෂය සඳහා

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2027 වර්ෂය සඳහා පහත සඳහන් සැපයුම් හා සේවාවන් සැපයීමට සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි කර ගැනීම පිණිස නිෂ්පාදකයින්ගෙන් ලියාපදිංචි ආයතනවලින් සහ පුද්ගලයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

<u>සැපයුම්</u>

01. ආයුර්වේද ඖෂධ වර් ග
02. බටහිර ඖෂධ වර් ග
03. වෛද්‍ය උපකරණ
04. රසායනාගාර උපකරණ හා රසායනාගාර රසායනික ද්‍රව්‍ය
05. ගිණි නිවීමේ උපකරණ (සවිකිරීම් ඇතුලුව)
06. සාමාන්‍ය ගබඩා ද්‍රව්‍ය (යකඩ, ජී අයි පයිප්ප, කම්බි, නාන කාමර හා වැසිකිලි අමතර කොටස්, ප්ලාස්ටික් ජලටැංකි, කොම්පෝස්ට් බැරල්, සෙවිලි ද්‍රව්‍ය)
07. තීන්ත වර්ග සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය
08. සෞඛ්‍ය ආශ්‍රිත උපකරණ (ඉදල්, කොසු, වේවැල් කූඩ, ප්ලාස්ටික් කුණු කූඩා, අත්වැසුම් ආදිය)
09. සෞඛ්‍ය ආරක්ෂිත ද්‍රව්‍ය (විම්, හාපික්, සබන් වර්ග, පයිනෝල්, එයා ෆ්‍රෙෂ්න, හෑන්ඩ් වොෂ්)
10. පාවහන් , සපත්තු, මේස් ආදිය
11. නිළ ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි වර්ග සහ ටී ෂර්ට්
12. රෙදි පිළි හා මදුරු දැල් (තිර රෙදි, බෙඩ්ෂීට්, කොට්ට උර, කොට්ට)
13. ඇලුමීනියම් භාණ්ඩ, පිගන් භාණ්ඩ හා වීදුරු භාණ්ඩ, ප්ලාස්ටික් භාණ්ඩ
14. ක්‍රීඩා භාණ්ඩ හා කායවර්ධන උපකරණ
15. ටයර්, ටියුබ් සහ බැටරි (වාහන සහ යන්ත්‍ර සඳහා)
16. වාහන අමතර කොටස් (වෑන්, මෝටර් සයිකල්, ට්‍රැක්ටර්, ගල්රෝල්, ටිපර්, ත්‍රීවිල් රථ, අත් කරත්ත, බැකෝ ඇතුලු සියලුම වාහන වල අළුත් සහ භාවිතා කරන ලද අමතර කොටස්)
17. කාර්යාල විදුලි උපකරණ (කේතල්, විදුලි පංකා, ශීතකරණ, රයිස් කුකර් ආදිය)
18. CCTV කැමරා, කැමරා, අගිලි සලකුණු යන්ත්‍ර හා ඒ ආශ්‍රිත උපාංග
19. කාර්යාල උපකරණ (ලී සහ වානේ ගෘහ භාණ්ඩ , අල්මාරි, මේස, ලිපිගොනු, ප්ලාස්ටික් පුටු, කබඩ්)
20. කාර්යාල විදුලි උපකරණ (ජායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ , ලැමිනේටින් යන්ත්‍ර , ඩුප්ලෝ යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර වැනි)
21. පරිගණක සහ උපාංග (පරිගණක, සර්වර්, ප්‍රින්ටර්, පරිගණක බැටරි, මල්ටි මීඩියා යන්ත්‍ර)
22. මුද්‍රණ යන්ත්‍ර සඳහා ටෝනර් වර්ග හා රිබන් වර්ග, ඉන්ක් වර්ග, කාඩ්රිජ්
23. විදුලි සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය උපාංග (වයර්, ස්විච්, බල්බ්, ප්ලග් ආදිය)
24. කාර්යාලීය ලිපිද්‍රව්‍ය
25. මුද්‍රණ කටයුතු (මුද්‍රිත පෝරම, පොත් පත් ආදිය)
26. ගොඩනැගිලි ද්‍රව්‍ය (වැලි, ගල්, මැටල් ආදිය)
27. කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන (හියුම් පයිප්ප, කොන්ක්‍රීට් කණු, මායිම් ගල්, බ්ලොක් ගල්, ආදිය)
28. සිමෙන්ති, කොන්ක්‍රීට් පෙරමුසු, ප්‍රිමික්ස්, හොට් මික්ස් ආදිය
29. දහර කම්බි

30. ඉරන ලද දැව
31. ලිහිසි තෙල් (ග්‍රීස්, ඉන්ධන, පවර් ස්ටියරින් ඉන්ධන ආදිය)
32. කෝලා තාර
33. පොහොර සහ රසායනික ද්‍රව්‍ය (රසායනික පොහොර සහ සත්ව පොහොර)
34. ජලය පිරි පහදු කිරීමේ රසායනික ද්‍රව්‍ය (ඇලුමීනියම් සල්පේට්/හයිඩ්‍රේටඩ් ලයිම්, ක්ලෝරීන්, ටීසීඑල් පවුඩර්)
35. ජල පොම්ප සඳහා බෙයාරින්
36. ජල නල උපාංග සහ අමතර කොටස්
37. පොත් /පුවත් පත් සගරා මිලදී ගැනීම
38. ආරක්ෂිත උපකරණ (ආරක්ෂිත කබා, වැහි කබා හෙල්මට් ආදිය)
39. උද්‍යාන සඳහා අවශ්‍ය පැල, බීජ මල්පැල, පිඩලි ආදිය
40. කැනපි ටෙන්ට් රෙදි සහ තිර රෙදි ආදිය
41. පදක්කම්, පලිහ, පිත්තල, නාමපුවරු, කුසලාන, නිල මුද්‍රා, ලාංඡන, සමරුපලක, යතුරු කැපීම
42. විදුලි බලවේග කට්ටල (විදුලි කියත් ඩ්‍රිල් මැෂින් ආදිය)
43. වැඩ කර්මාන්ත හා ඉදිකිරීම් කර්මාන්ත ආශ්‍රිත උපකරණ
44. ආහාර පාන සැපයීම (බේකරි නිෂ්පාදන, කෑම පාර්සල්, කෙටි කෑම, කේටරින්)
45. විදුලි ආලෝක කරණය සහ උපාංග සැපයීම
46. ප්‍රදර්ශන කුටි පුටු මේස උත්සව භාණ්ඩ සැපයීම
47. ගිණි නිවීමේ උපකරණ හා අනෙකුත් ආරක්ෂක උපකරණ හා රසායනිකද්‍රව්‍ය
48. බැනර්, කොඩි, ඩිජිටල් ප්‍රින්ටින්, ඩිජිටල් තිර සැපයීම
49. ශබ්ද විකාශන සහ අනෙකුත් සන්නිවේදන උපකරණ මිලදී ගැනීම
50. ළමා උද්‍යාන සඳහා අවශ්‍ය උපකරණ (ෆයිබර්, ප්ලාස්ටික් වැනි)
51. ජල මීටර්, ජල පොම්ප, ජල මෝටර්, ජල පිරිපහදු කිරීමේ විදුලි උපකරණ, ජල පිරිපහදු කිරීමේ විදුලි උපකරණ, ජල පිරිපහදු කිරීමේ පද්ධතියට අවශ්‍ය උපකරණ ආදි භාණ්ඩ සඳහා අවශ්‍ය අමතර කොටස්

<u>සේවාවන්</u>

1. ජල පොම්ප, ජල මෝටර්, විදුලි මෝටර්, ජලය පිරිපහදු කිරීමේ පද්ධතිය අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
2. රෝනියෝ යන්ත්‍ර , ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
3. ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම
4. පරිගණක යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
5. පුටු විවීම සහ පුටු කුෂන් කිරීම සහ ගෘහ භාණ්ඩ අලුත්වැඩියාව හා සේවා කිරීම
6. ඇඟිලි සලකුණු යන්ත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
7. CCTV කැමරා හා කැමරා අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම
8. වාහන කුලියට සැපයීම හා සේවා කිරීම (ට්‍රැක්ටර්, මගී වාහන, ටිපර් රථ, කම්පැක්ටර් රථ, ගස් කපන යන්ත්‍ර ආදිය)
9. ටයර් නැවත පිරවීම, ටයර් ඩැක් කිරීම සහ පැරණි ටයර් මිලදී ගැනීම හා සේවා කිරීම (විකිනීම)
10. යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ කුළියට සැපයීම, අළුත්වැඩියාව හා සේවා කිරීම
11. සම්පත් පියස භාණ්ඩ විකිණීම හා සේවා කිරීම (කාඩ්බෝඩ් යකඩ පිත්තල ප්ලාස්ටික් සහ කැබළි කරන ලද ප්ලාස්ටික් ආදිය)
12. කැනපි පුටු පිගන් කෝප්ප ආදිය උත්සව භාණ්ඩ කුලියට සපයා ගැනීම හා සේවා කිරීම
13. වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම

14. ජෙනරේටර් අලුත්වැඩියාව හා සේවා කිරීම
15. ෆයිබර් සහ ඇලුමීණියම් භාණ්ඩ අලුත්වැඩියාව හා සේවා කිරීම (සෙල්ලම්බඩු, පුටු ආදිය)
16. ක්‍රීඩා භාණ්ඩ අලුත්වැඩියාව හා සේවා කිරීම (බර ඉසිලීමේ යන්ත්‍ර, ට්‍රෙඩ්මිල්, ආදිය)
17. ශබ්ද විකාශන යන්ත්‍ර හා ඒ ආශ්‍රිත අනෙකුත් උපකරණ අලුත්වැඩියාව හා සේවා කිරීම
18. අයුර්වේද ආශ්‍රිත නිෂ්පාදන යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම (බෙහෙත් වියලන හා ඇබරුම් යන්ත්‍ර ආදිය)
19. ගෑස් නල පද්ධති අළුත්වැඩියාව
20. අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම
21. වෙනත්

ඉහත සඳහන් එක් එක් සැපයුම් සහ සේවාවන් සඳහා වෙන් වෙන්ව ලියාපදිංචිවීම සඳහා එක් අයිතමයක් වෙනුවෙන් රු. 2360/-ක බදු ඇතුලත් ගාස්තුවක් අයකරනු ලැබේ. 2026.10.30 සිට 2026.11.30 දින දක්වා රජයේ වැඩකරන දිනවල පෙ. ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා මහා නගර සභාවේ සැපුම් අංශයෙන් අයදුම්පත් ලබා ගත හැකි අතර නොඑසේ නම් අපගේ වෙබ් අඩවිය වන http://kandy.mc.gov.lk මගින් අයදුම්පත් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.12.01 දින වේ. අයදුම්පත් සමග ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් හා වැට් බදු ගෙවන්නේ නම් ඒ සඳහා ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළයුතු වේ.

මුදල් ගෙවීම දිවයින තුළ පිහිටි ලංකා බැංකු ශාඛාවකට මහනුවර මහානගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක 0000032764 දරණ ගිණුමට මුදලින් පමණක් ගෙවීම සිදු කර ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතු වේ. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් ගණකාධිකාරී (සැපයුම්) මහ නගර සභාව, මහනුවර නමින් 2026.11.30 දිනට හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැකිය. නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කොන්දේසි

1. ලියාපදිංචි සැපයුම්කරුවන්ට අමතරව අවශ්‍ය අවස්ථාවන්වලදී වෙනත් මිළ ගණන් කැඳවා භාණ්ඩ මිලදී ගැනීමේ බලය මෙම සභාවට/ නාගරික කොමසාරිස්ට ඇත.
2. අවශ්‍ය අවස්ථාවලදී සාම්පල් හා ආකෘති ඉදිරිපත් නොකරන හා ඇණවුම් පරිදි නියමිත වේලාවට ප්‍රමිතියට සහ උසස් ගුණාත්මක භාණ්ඩ නොසපයන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ලැබිය හැකිය.
3. භාණ්ඩ සැපයූ දින සිට අවම වශයෙන් දින 45ක ණය පහසුකම් සැපයුම්කරුවන් විසින් ලබා දිය යුතුය.
4. සැපයුම්කරුවන්ට අත්තිකාරම් මුදල් ගෙවනු නොලැබේ.
5. සෑම අයදුම්පතක් සමගම ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් වෙන වෙනම අමුණා එවිය යුතුවේ.

වැඩි විස්තර ගණකාධිකාරී (සැපයුම්) ගේ දුරකථන අංක 081-2232071 මගින් ලබා ගත හැකිය.

2026.10.

මහා නගර සභාව

මහනුවර මහා නගර සභාව

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ

නාගරික කොමසාරිස්

මහනුවර මහා නගර සභාව